# <u>දකුණු පළාත් සභාව</u>

## <u>2019 වර්ෂය සදහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

**<u>2019 වර්ෂය සදහා දකුණු පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු/ආයතන වලට අවශ්‍ය,ද්‍රව්‍ය,උපකරණ සහ සේවාවන් සැපයීම හා ඉදිකිරීම් සදහා ලියාපදිංචි වීමට කැමති රාජ්‍ය සංස්ථා/රජයට පවරාගත් වෙළද ආයතන/ පෞද්ගලික ව්‍යාපාර/ සැපයුම්කරුවන්/ නිෂ්පාදකයින් /බෙදාහරින්නන් සහ ඉදිකිරීම් වැඩ සදහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැදවනු ලැබේ.</u>**

**01). කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**

**සුදුසුකම්**

I). දකුණු පළාතේ ස්ථිර පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට සහ පළාත තුල ස්වකීය ව්‍යාපාර හෝ ශාඛා ආයතන පවත්වාගෙන යන කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් සදහා ලියාපදිංචි විය හැකි අතර **"ඉදිකිරීම් සදහා සෑම කොන්ත්‍රාත්කරුවෙක්ම <u>ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය</u>"**<u>(CIDA)</u> ආයතනයේ ලියාපදිංචි වී සිටිය යුතුය.(අයදුම්පත්‍රය සමග ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

**02). සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.**

**සුදුසුකම්**

I.) 2019 වර්ෂය සදහා දකුණු පළාත් සභාවේ රාජ්‍ය ආයතන සදහා ද්‍රව්‍ය උපකරණ , සැපයුම් හා සේවාවන් සැපයීම සදහා ව්‍යාපාර පවත්වාගෙන යන සැපයුම්කරුවන්ට ඒ සදහා ලියාපදිංචි විය හැකි අතර,ව්‍යාපාරය ලියාපදිංචි කර තිබිය යුතුය.(අයදුම්පත්‍රය සමග ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

II.) ඔබගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සදහා තිබිය යුතු විශේෂ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් වේනම්,එම බලපත්‍රය , අවසර පත්‍රය හෝ ලියාපදිංචි සහතිකය අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

III.) ආපන ශාලා පවත්වාගෙන යාම සදහා මහ නගර සභා බල ප්‍රදේශයක නම් ,ආහාර පනතට අනුකූලව කටයුතු කරන බවට මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ සහතිකයද,ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ සහතිකයද තිබිය යුතුය. (අයදුම් පත්‍රය සමග පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

IV). සැපයුම් හා සේවා ඇණවුම් සැපයීමට අවශ්‍ය මූල්‍යමය හා අනිකුත් හැකියාවන් ඇති බවට ලිඛිත සාක්ෂි සැපයිය යුතුය.

V.) වැට් බදු ගෙවීම සදහා ලියාපදිංචි වී ඇත්නම් ඊට අදාල ලියකියවිලි වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**03.) අයදුම්කිරීම හා ලියාපදිංචි කිරීම.**

I.) නිසි පරිදි සකස් කරන ලද අයදුම්පත් 2018.09. 14 සිට 2018.11.15 දින දක්වා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට භාරදිය යුතුය.එක් ව්‍යාපාරයක්/ආයතනයක් සදහා එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත්කළ යුතු අතර එක් අයදුම්පත්‍රයක් මගින් **අයිතම ඕනෑම ප්‍රමාණයක් ඉදිරිපත්කළ හැකිය**.එක් අයිතමයක් සදහා ලියාපදිංචි ගාස්තු රු. 300/- ක් බැගින් ගෙවිය යුතු අතර එය **ප්‍රධාන ලේකම්,දකුණු පළාත** නමින් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සරප් වෙත හෝ දකුණු පළාත තුල පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දකුණු පළාත් සභාවට අයත් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තුවකට ගෙවා (එනම් දකුණු පළාත් සභාව නමින් ලදුපතක් නිකුත් කළ හැකි රජයේ පළාත් සභා ආයතනයකට) ලදුපතක් ලබා ගත යුතුය.**එම ලදුපතෙහි මුල් පිටපත අයදුම්පත්‍රය සමග එවිය යුතුය.** මුදල් ඇණවුමකින් ගෙවීම් කරන්නේ නම් ලබන්නා **"ප්‍රධාන ලේකම්,දකුණු පළාත"**සහ ගෙවන කාර්යාලය **"ගාල්ල"** යන්න සදහන් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි ගාස්තු ප්‍රධාන ලේකම් නමින් ලංකා බැංකුව, ගාල්ල කොටුව ශාඛාවෙහි ඇති ගිණුම් අංක 1587305 දරණ ගිණුමට බැර කර රිසිට් පත අයදුම් පත්‍රය සමග එවිය යුතුය.

II.) කොන්ත්‍රාත්කරුවන් සඳහා ලියාපදිංචි ගාස්තු පහත පරිදි ගෙවිය යුතුය.

(අ) කොන්ත්‍රාත් සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය **CIDA** ලියාපදිංචි හා ලියාපදිංචි ගාස්තු ප්‍රමාණයන් ;

1. රු . මිලියන 02 ට අඩු කොන්ත්‍රාත් සඳහා (C – 9) - රු. 1,000.00
2. රු . මිලියන 02 සිට රු . මිලියන 05 දක්වා (C – 8) (C-7) - රු. 1,000.00
3. රු . මිලියන 05 සිට රු. මිලියන 10 දක්වා (C – 6) - රු. 2,000.00
4. රු . මිලියන 10 සිට රු . මිලියන 20 දක්වා (C – 5) - රු. 2,000.00

III) ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවිය වන **www.cs.sp.gov.lk හි** පළමු පිටුවෙහි ප්‍රසම්පාදනය යටතේ **සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 2019** (Procurement⟶ Suppliers and Constructers' Registration – 2019) මගින් අයදුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු හා අයදුම්පත්‍රය ලබා ගැනීමට හෝ **online** ක්‍රමය ඔස්සේද ලියාපදිංචි විය හැකිය.

IV.) අයදුම්පත්‍ර 2018.11.15 වෙනි දින ප:ව 3.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් **ගණකාධිකාරී(සැපයුම්), ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච් දහනායක මාවත,ගාල්ල** යන ලිපිනයට එවීම හෝ අතින් ගෙනවිත් **ගණකාධිකාරී (සැපයුම්)** වෙත භාර දීම හෝ කළ හැකි අතර **online** ක්‍රමයට ද ලියාපදිංචි විය හැකිය.

V.) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"2019 සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම "** යනුවෙන් සඳහන් කළ යුතුය.

**වෙනත් කොන්දේසි -:**

01. මිල ගණන් කැඳවීම, ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කරනු ලබන අතර,දකුණු පළාත් සභාවේ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්/කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතු වේ.
02. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත්‍රය සලකා බලා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙත ඇති හැකියාවන් සහ සුදුසුකම් මත පමණක් එකී අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය හා හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතුය.
03. ලියාපදිංචි කර ගන්නා සියලුම සැපයුම්කරුවන්ට/කොන්ත්‍රාත්කරුවන්ට ලියාපදිංචි කළ බව ලිඛිතව දැනුම් දෙනු ලැබේ.
04. යම් සැපයුම්කරුවෙකුගේ /කොන්ත්‍රාත්කරුවෙකුගේ සේවය සැපයීම පිළිගත නොහැකි මට්ටමට දුර්වල තත්වයක පවතින්නේ නම් හෝ සැපයුම්/කොන්ත්‍රාත් කටයුතු කිරීමේදී යම් වංචා සහගත ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවයක යෙදුන බවට තහවුරු වුවහොත් එම ආයතන අසාධු ලේඛනයට ඇතුලත් කොට මින් ඉදිරියට සැපයුම්කරුවකු/කොන්ත්‍රාත්කරුවෙකු ලෙස පිළිනොගැනීමට කටයුතු කළ හැක.ඒ පිළිබඳ වූ පූර්ණ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතු වන්නේය.
05. ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කරමින් භාණ්ඩ සැපයීමක් සඳහා හෝ සේවාවන් සඳහා ලියාපදිංචි වන ආයතන හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් දැඩි නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

06.සියලුම අයදුම්කරුවන්ගේ සුදුසුකම්,හැකියාවන් හා යෝග්‍යතාවයන් පිළිබඳව පරික්ෂාවට ලක්කිරීමෙන් අනතුරුව ලියාපදිංචිය සිදු කරන බව කාරුණිකව සලකන්න.

07.ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් වෙතොත් 091- 4946368 / 091- 4944016 /091- 4119011 දුරකථන අංක ඇමතීමෙන් හා supply@cs.sp.gov.lk හෝ wasanthar@live.com යන E mail ලිපිනයට E mail පණිවුඩයක් එවීමෙන් විස්තර ලබා ගත හැකිය.

**ලිපිනය :**
**ප්‍රධාන ලේකම්,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**එස්.එච් දහනායක මාවත,**
**ගාල්ල.**

**ආර්.සී ද සොයිසා,**
**ප්‍රධාන ලේකම්,**
**දකුණු පළාත.**
**දිනය:- 2018.09.14**

## දකුණු පළාත් සභාව

## 2019 සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

| අයිතම අංකය | අයිතම විස්තරය |
|---|---|
| | **01.කාර්යාලීය උපකරණ සැපයීම.** |
| 01-01 | කාර්යාලීය ලී බඩු උපකරණ සැපයීම.(යකඩ,ප්ලාස්ටික්,ෆයිබර්,MDF හා දැවමිශ්‍ර) |
| 01-02 | ඡායා පිටපත් යන්ත්‍ර,යතුරු ලියන යන්ත්‍ර,රෝනියෝ යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර,වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර ,ප්ලොටර් යන්ත්‍ර මිලදී ගැනීම,බයින්ඩින් යන්ත්‍ර,ලැමනේටින් යන්ත්‍ර,සැලසුම් මුද්‍රණ යන්ත්‍ර සැපයීම. |
| 01-03 | කැමරා ප්‍රොජෙක්ටර්,ආරක්ෂිත කැමරා,වීඩියෝ උපකරණ හා ශබ්ද විකාශන යන්ත්‍ර,(රූපවාහිනී,වීසීඩී/ඩීවීඩී යන්ත්‍ර,ඩෙක් යන්ත්‍ර,ටේප් රෙකෝඩර්,රේඩියෝ හා ඩෙක්පීස්,හිස් කැසට් පීස් ආදිය සැපයීම. |
| 01-04 | වායුසමන යන්ත්‍ර සැපයීම. |
| 01-05 | පරිගණක යන්ත්‍ර සැපයීම. |
| 01-06 | පා පැදි සැපයීම. |
| 01-07 | ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම. |
| 01-08 | මිනින්දෝරු උපකරණ. |
| 01-09 | කිරුම් මිනුම් උපකරණ සැපයීම. |
| 01-10 | ගිනි නිවන උපකරණ සැපයීම. |
| 01-11 | පානීය ජලය හා ජල සැපයුම (ජල පෙරන ) උපකරණ සැපයීම. |
| | **02.කාර්යාලීය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම.** |
| 02-01 | ලිපි ද්‍රව්‍ය සැපයීම හා පාසල් උපකරණ සැපයීම. |
| 02-02 | පරිගණක යන්ත්‍ර හා කාර්යාලීය යන්ත්‍ර පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම.(ඩිස්කට් සීඩී/ඩීවීඩී තැටි රිබන්,පෙන් ඩ්‍රයිව්,ටෝනර්,කාඩ්රිජ්,ප්ලොටර් යන්ත්‍ර කාඩ්රිජ්) |
| 02-03 | රබර් මුද්‍රා,දින මුද්‍රා , නාම පුවරු හා දැන්වීම් පුවරු සැකසීම හා සැපයීම. |
| 02-04 | කාර්යාලීය සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම. |
| 02-05 | පදක්කම්,සමරු තිළිණ,සමරු ඵලක හා කුසලාන සැපයීම. |
| | **03.කාර්යාලීය සේවා සැපයීම.** |
| 03-01 | කාර්යාලීය මුද්‍රණ කටයුතු,පින්තූර රාමු කිරීම හා දැන්වීම් පුවරු ඇඳීම සහ සැකසීම. |
| 03-02 | පරිගණක , ඡායා පිටපත් යන්ත්‍ර ඇතුලු කාර්යාලීය යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම. |
| 03-03 | අභ්‍යන්තර දුරකථන සේවා හා ඇමතුම් සේවා සැපයීම හා අලුත්වැඩියා කිරීම. |
| 03-04 | කාර්යාලීය උපකරණ අලුත්වැඩියා හා නඩත්තු සේවා සැපයීම. |
| 03-06 | පරිගණක ජාලගත කිරීම, පරිගණක මෘදුකාංග සකස් කිරීම හා සංවර්ධනය, ස්ථාපිත කිරීම හා උපදේශාත්මක සේවා. |
| 03-07 | ආරක්ෂක සේවා සැපයීම. |
| 03-08 | සනීපාරක්ෂක සේවා සැපයීම. |
| 03-09 | විදුලි උපකරණ හා විදුලි ජනක යන්ත්‍ර අලුත්වැඩියාව. |
| 03-10 | නිල ඇඳුම් සහ රෙදි මැසීමේ (තිර රෙදි,වෙනත්) සේවා සැපයීම. |
| 03-11 | පුහුණු නුපුහුණු ශ්‍රම සැපයුම.(පෙදරේරු,වඩු කාර්මික,විදුලි කාර්මික) |
| 03-12 | නර්තන අංග වලට අදාල නර්තන වස්ත්‍රාභරණ සැපයීම. |
| 03-13 | නර්තන සහ සංගීත භාණ්ඩ අලුත්වැඩියා කිරීම. |
| 03-14 | ළදරුවන්ට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම. |

| අයිතම අංකය | අයිතම විස්තරය |
|---|---|
| 03-15 | පෑස්සුම් ,යකඩ හා ඇලුමිනියම් ආශ්‍රිත සේවාවන්. |
| 03-16 | රූපලාවන්‍ය හා අත්කම් පාඨමාලා සඳහා උපකරණ සැපයීම. |
| 03-17 | බොයිලේරු අලුත්වැඩියාව. |
| 03-18 | ප්ලොටර් යන්ත්‍ර අලුත්වැඩියාව. |
| 03-19 | පලිබෝධනාශක යෙදීමේ සේවා සැපයීම. |
| | **04. පාසල් උපකරණ සැපයීම** |
| 04-01 | පාසල් ලී බඩු උපකරණ සැපයීම.(ඩෙක්ස්,පුටු,මේස) දැව හා යකඩ ප්ලිස්ටික් මිශ්‍ර දැව |
| 04-02 | චිත්‍ර විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-03 | විද්‍යා රසායනාගාර විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-04 | සංගීත/නැටුම්/තූර්යවාදන විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-05 | නොවිධිමත් අධ්‍යාපනික උපකරණ සැපයීම. |
| 04-06 | විශේෂිත අධ්‍යාපනික විෂය උපකරණ සැපයීම. (අඳ,ගොළු හා බිහිරි ළමුන් සඳහා) |
| 04-07 | පාසල් වාර විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම. |
| 04-08 | පාවහන්,බෑග්,වතුර බෝතල් ,කෑම පෙට්ටි හා හම් ආශ්‍රිත නිෂ්පාදන සැපයීම. |
| 04-09 | ගණිතාගාර උපකරණ සැපයීම. |
| | **05.පුස්ථකාල පොත් හා ග්‍රන්ථ සැපයීම.** |
| 05-01 | පුස්ථකාල පොත් හා ග්‍රන්ථ සැපයීම. |
| | **06.ක්‍රිඩා භාණ්ඩ සැපයීම.** |
| 06-01 | ක්‍රිඩා භාණ්ඩ සැපයීම. |
| 06-02 | ක්‍රිඩා භාණ්ඩ අලුත්වැඩියා කිරීම. |
| 06-03 | ක්‍රිඩා නිල ඇඳුම් සැපයීම. |
| 06-04 | පිහිණුම් තටාක නඩත්තු රසායනික ද්‍රව්‍ය සැපයීම හා ඊට අදාල උපකරණ සැපයීම. |
| | **07.ඇගලුම් කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම.** |
| 07-01 | පේෂ කර්ම අත් යන්ත්‍ර,පේෂ කර්ම උපකරණ සහ මහන මැෂින්, අමතර කොටස් සැපයීම. |
| 07-02 | රෙදි පිළි නූල් වර්ග හා ඩයි වර්ග සැපයීම.(ග්‍රේ නූල් (දේශීය/විදේශීය 2/30,2/20,2/100,2/80,1/16,1/10,1/50,1/40,1/60) |
| 07-03 | ග්‍රේ නූල් වර්ණ කිරීමට ගන්නා රසායන ද්‍රව්‍ය හා සායම් වර්ග සැපයීම. |
| 07-04 | නිමි ඇඳුම් සැපයීම. |
| 07-05 | අප ජල පිරිපහදු ඒකකයන් සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය සැපයීම. |
| | **08. මැටි කර්මාන්තය සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍ය සැපයීම.** |
| 08-01 | පිඟන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා ඔක්සයිඩ් වර්ග,මැටි වර්ග(බියගම රතු මැටි,බොරලැස්ගමුවෙ මැටි,මීටියාගොඩ මැටි) ඩයි වර්ග,ෆෙල්ස් පාර්,ක්වාට්ස්, සිලිකා වැලි,ප්ලාස්ටර් ඔෆ් පැරිස්(ආනයනික/දේශීය) |
| 08-02 | පිඟන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය විදුලි පෝරණු,තාප කම්බි කට්ටල,පෝරණු ගල් සැපයීම. |
| 08-03 | මැටි කර්මාණ්තය සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ (බෝල් මිල් යන්ත්‍ර,සකපෝරු- Potter’s wheel |
| | **09. කොහු කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ සැපයීම.** |
| 09-01 | කොහු කර්මාණ්තය සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර හා උපකරණ සැපයීම. |
| 09-02 | පොල් ලෙලි,සුදු කොහු,කොහු ලණු වර්ග සැපයීම. |

| අයිතම අංකය | අයිතම විස්තරය |
|---|---|
| | **10.හස්ත කර්මාන්තය සඳහා උපකරණ සැපයීම.** |
| 10-01 | වඩු වැඩ හා මේසන් වැඩ සඳහා අවශ්‍ය කරන බහු කාර්යය යන්ත්‍ර හා ආයුධ කට්ටල් සැපයීම. |
| 10-02 | ලුහු ඉංජිනේරු උපකරණ සැපයීම. |
| 10-03 | හස්ත කර්මාණ්ත උපකරණ සැපයීම. |
| 10-04 | දැව පදම් කිරීම,දැව ඉරීම් හා දැව වර්ග සැපයීම (බෝවුඩ්,ගිණි සපු,කොස්,තේක්ක,දොඹ,කෙම්පස්,මහෝගනී) |
| 10-05 | දැව කර්මාන්තයේ අගය එකතු කළ භාණ්ඩ |
| | **11.ධීවර පශු සම්පත් හා කෘෂිකාර්මික** |
| 11-01 | කෘෂි යන්ත්‍ර සැපයීම(ධාන්‍ය පිටි සැකසීමේ යන්ත්‍ර/තලා පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර/ගොයම් කපන යන්ත්‍ර/පොප් කෝන් නිෂ්පාදන යන්ත්‍ර) |
| 11-02 | කෘෂිකාර්මික උපකරණ සැපයීම හා කෘෂි ආම්පන්න සැපයීම, කමත් අසුරණු/පැරෂුට් තවාන් තැටි/ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති/සෙවන දැල්/කුන්තානි(දහයියා අඟුරු කරනු ලබන බැරල්)වී තම්බන බැරල්/මෙට්රික් මී මැසි පෙට්ටි සැපයීම,කැති,පොරෝ,උදලු නගුල් ආදිය |
| 11-03 | කෘෂිකාර්මික උපකරණ සැපයීම.(වතුර පොම්ප,වෙනත් කෘෂි ආම්පන්න) |
| 11-04 | කෘෂිකාර්මික රෝපණ ද්‍රව්‍ය සැපයීම.බීජ වර්ග හා පැළ වර්ග (එළවළු ,බීජ / ආනයනික ලොකු ළූණු,/බීජ/ආනයනික බඩ ඉරිඟු බීජ/පැපොල්,බීජ/ වෙනත් වර්ග) |
| 11-05 | බීජ ලබා ගැනීම සඳහා අවශ්‍ය පලතුරු හා එළවළු සැපයීම.(දෙළුම්, කිලෝ පේර, ගස් ලබු,දෙහි,තිබ්බටු,මිටි ඇඹරුල්ලා,මිටි මුරුංගා ආදී) |
| 11-06 | අංකුර හා රිකිලි බද්ධ කිරීම. |
| 11-07 | බීජ හා පැළ රෝපණය කිරීම සඳහා අවශ්‍ය පොලිතීන් වර්ග සැපයීම. |
| | බිම්මල් නිෂ්පාදන ක්‍රියාවලිය හා අවශ්‍ය උපකරණ සැපයීම.(බිම්මල් මලු තම්බන ජීවානුහරණ යන්ත්‍ර,බිම්මල් කුඩු මිශ්‍ර කරන උපකරණ, බිම්මල් මලු පුරවන යන්ත්‍ර හා Misters System) |
| 11-08 | පොහොර වර්ග |
| 11-09 | කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයීම.(වල් නාශක/කෘමි නාශක) |
| 11-10 | සත්ව ආහාර, බෙහෙත් හා උපකරණ සැපයීම. (ගව,කුකුලු,බ්‍රොයිලර්,ඌරු,ආහාර) |
| 11-11 | කෘෂිකාර්මික හා ආර්ථික කටයුතු සඳහා යොදා ගන්නා සියලුම සතුන් සැපයීම. |
| 11-12 | හෝමෝන(කෘෂිකාර්මික සතුන්ගේ අභිජනනන කටයුතු සඳහා අවශ්‍ය) |
| 11-13 | ගොවිපල සඳහා අවශ්‍ය උපකරණ හා භාණ්ඩ (වැහි කබා,ගම්බූට්ස්,බිත්තර අසුරන තැටි,යෝගට් කප් හා හැඳි,කිරි හට්ටි,කුකුල් දැල්,රෝල්) |
| 11-14 | ධීවර කර්මාන්තය සඳහා උපකරණ සැපයීම.(මත්ස්‍ය දැල් සැපයීම,ෆයිබර් ග්ලාස් මාලු පෙට්ටි(ලොකු/කුඩා),මිරිදිය ධීවර ඔරු,( ෆයිබර් ග්ලාස්),ජීවිතාරක්ෂක කබා, GPS උපකරණ) |
| 11-15 | ධීවර කර්මාන්තයට අවශ්‍ය මත්ස්‍ය හා මත්ස්‍ය ඇඟිල්ලන් සැපයීම. |
| 11-16 | වෙළඳ ප්‍රජාව වෙත (50%) ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය උපකරණ සැපයීම.(ඉඳි ආප්ප පිටි ඇනීමේ යන්ත්‍ර හා ඉඳි ආප්ප වත් කිරීමේ යන්ත්‍ර,පාන් පෙති කපන යන්ත්‍ර ඇතුලුව) |
| | **12.සෞඛ්‍ය ආරක්ෂක උපකරණ හා ඖෂධ වර්ග හා සේවා සැපයීම.** |
| 12-01 | බටහිර ඖෂධ වර්ග සැපයීම. |
| 12-02 | විකිරණ යන්ත්‍ර හා එක්ස් රේ පටල ඇතුළු අනෙකුත් විකිරණ උපාංග සැපයීම. |
| 12-03 | ආයුර්වේද ඖෂධ වර්ග සැපයීම. |
| 12-04 | ශල්‍ය උපකරණ සැපයීම. |

| අයිතම අංකය | අයිතම විස්තරය |
|---|---|
| 12-05 | ශල්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම. |
| 12-06 | රසායනාගාර පරීක්ෂණ සඳහා වන පාරිභෝගික ද්‍රව්‍ය හා රසායනික ද්‍රාවණ සැපයීම. |
| 12-07 | වෙනත් වෛද්‍ය උපකරණ,පාරිභෝගික උපාංග(බැන්ඩේජ් රෝල්,ගෝස් රෝල්,ප්ලාස්ටර් රෝල්,මිනුම් සරා,ඩෙටෝල්,කපු පුළුන්,සර්ජිකල් ස්ප්‍රීට්,ඩිස්පොසිබල් ග්ලව්ස්,බෙහෙත් ඇසුරුම් කවර)හා ද්‍රාවණ සැපයීම. |
| 12-08 | රසායනාගාර උපකරණ සැපයීම. |
| 12-09 | රෝහල් ඇඳන්,ස්ක්‍රීන්,රෝද පුටු,සූතිකාගාර ඇඳන්,රෝහල් වලට බෙහෙත් අල්මාරි,ට්‍රොලි,රෝහල් ස්ථාම,(ලොකර්),සේලයින් ස්ටෑන්ඩ්,ආදිය සැපයීම. |
| 12-10 | දේශීය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැපයීම |
| 12-11 | දන්ත ශල්‍ය වෛද්‍ය මෙවලම් හා ද්‍රාවණ සැපයීම. |
| 12-12 | අක්ෂි වෛද්‍ය උපකරණ සැපයීම. |
| 12-13 | ඔක්සිජන් හා ගෑස් සැපයීම. |
| 12-14 | වෛද්‍ය උපකරණ සැපයීම. |
| 12-15 | මදුරු දැල් සැපයීම. |
| 12-16 | මෙට්ට සැපයීම. |
| 12-17 | මුළුතැන්ගෙයි උපකරණ සැපයීම. |
| 12-18 | කරණවෑම් සේවා සැපයීම. |
| 12-19 | කැළි කසළ එකතු කිරීම හා ප්‍රවාහනය ඇතුළු සනීපාරක්ෂක කටයුතු. |
| 12-20 | රෙදි සේදීම හා පිරිසිදු කිරීම. |
| 12-21 | හිස් මිනී පෙට්ටි සැපයීම. |
| 12-22 | හිමිකම් නොපාන මළ සිරුරු වල දැමීමේ සේවාව. |
| | **13.ආහාර ද්‍රව්‍ය සැපයීම.** |
| 13-01 | කෙටි ආහාර,බීම වර්ග, අතුරුපස කෑම වර්ග හා කේටරින් සේවා සැපයීම. |
| 13-02 | අමු ආහාර , පිසූ ආහාර හා පලතුරු වර්ග සැපයීම. |
| 13-03 | වියලි ආහාර ද්‍රව්‍ය සැපයීම. |
| 13-04 | එළවළු හා මස් මාළු සැපයීම. |
| | **14.වාහන අලුත්වැඩියාව හා අමතර කොටස් සැපයීම.** |
| 14-01 | සියලුම වර්ගයේ මෝටර් රථ අමතර කොටස් සැපයීම. |
| 14-02 | ටයර් ,ටියුබ් හා බැටරි. |
| 14-03 | වාහන අලුත්වැඩියා කිරීම. |
| 14-04 | වාහන කුෂන් කිරීම.(ටෙන්ට් රෙදි මැසීම,ෂීට් කවර දැමීම.) |
| 14-05 | වාහන සේවා කිරීම. |
| 14-06 | වාහන රක්ෂණ සේවා. |
| 14-07 | රියදුරු පුහුණු පාඨමාලා. (සැහැල්ලු වාහන/බර වාහන/ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ) |
| | **15.ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම.** |
| 15-01 | ගොඩනැගිලි උපකරණ ඉදිකිරීම්,ද්‍රව්‍ය හා ගොඩනැගිලි සවි කිරීම්,කටු කම්බි ආදී උපකරණ සැපයීම. |
| 15-02 | විදුලි උපකරණ,උදුන්,විදුලි පංකා,ශීතකරණ හා විදුලි ජනක යන්ත්‍ර සැපයීම. |
| 15-03 | තීන්ත වර්ග,වාර්නිෂ් හා තීන්ත ආලේප කිරීමට ගනු ලබන ද්‍රව්‍ය සැපයීම. |

| අයිතම අංකය | අයිතම විස්තරය |
|---|---|
| 15-04 | වීදුරු සැපයීම. |
| 15-05 | ජල හා විදුලි සම්බන්ධතා උපකරණ සැපයීම.(වතුර පොම්ප,වයර් ආදිය) |
| 15-06 | විදුලි කාර්මික සේවා සැපයීම. |
| | **16.මාර්ග සංවර්ධන හා අලුත්වැඩියා සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය සැපයීම.** |
| 16-01 | කළුගල් සැපයීම. (1/2",3/4",1 1/2",6"×9" ඒබීසී මිශ්‍ර ගල් හා CI මිශ්‍ර ගල්) |
| 16-02 | වැලි සැපයීම. |
| 16-03 | හියුම් පයිප්ප සැපයීම. |
| 16-04 | කොන්ක්‍රීට් වර්ග සැපයීම.(රෙඩි මික්ස් හා ඇස්පෝල්ට්) |
| 16-05 | තාර හා තාර ආශ්‍රිත නිෂ්පාදන සැපයීම. (ඉමල්ෂන්,60/70,80/100) |
| | **17.ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සේවා** |
| 17-01 | ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාව. |
| 17-02 | මාර්ග ඉදිකිරීම හා අලුත්වැඩියාව. |
| 17-03 | වැව් අමුණු ,ඇළ මාර්ග,ක්‍රීඩා පිට්ටනි,ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය |
| 17-04 | උපදේශාත්මක සේවා සැපයීම - ඉදි කිරීම් සඳහා උපදේශාත්මක සේවාවන් සැපයීම. |
| 17-05 | උපදේශාත්මක සේවා සැපයීම,යාන්ත්‍රික ඉංජිනේරු හා මළ ප්‍රවාහන/ජලනල පරිපථ සැලසුම් හා උපදේශාත්මක සේවා. |
| 17-06 | උපදේශාත්මක සේවා සැපයීම,විදුලි ඉංජිනේරු පරිපථ සැලසුම් හා උපදේශාත්මක සේවා සැපයීම. |
| 17-07 | උද්‍යාන අලංකරනය. |
| 17-08 | ගෘහ අලංකරනය. |
| 17-09 | පුහුණු නුපුහුණු ශ්‍රම සැපයුම. (පෙදරේරු,වඩු කාර්මික,විදුලි උපකරණ) |
| 17-10 | මෘත දේහ,ආදාහනාගාර පෝරණු වල නඩත්තු හා අලුත්වැඩියාව. |
| | **18.උත්සව භාණ්ඩ සැපයීම.** |
| 18-01 | ශබ්දවාහිනී කුලියට සැපයීම. |
| 18-02 | කූඩාරම්,වේදිකා,තොරන් හා වර්ණ ධජ කුලියට සැපයීම. |
| 18-03 | සැරසිලි සඳහා ස්වභාවික මල් හා කෘතිම මල් සැපයීම. |
| 18-04 | ප්‍රොජෙක්ටර්,ස්ක්‍රීන් හා ලැප්ටොප් ආදිය කුලියට දීම. |
| 18-05 | අලංකරන කටයුතු සඳහා විදුලි බුබුළු හා ආලෝකකරණ උපකරණ සැපයීම. |
| 18-06 | පුටු,මේස,පිඟන්,කෝප්ප,හැදි,ගෑරුප්පු හා කෑම පිසින උපකරණ කුලියට දීම. |
| | **19.ප්‍රවාහන සේවා** |
| 19-01 | ප්‍රභූ ප්‍රවාහන සේවා හා මගී ප්‍රවාහන සේවා කුලියට සැපයීම. |
| 19-02 | භාණ්ඩ ප්‍රවාහන සේවා කුලියට සැපයීම. |
| 19-03 | බර වාහන හා බූම් ට්‍රක්රථ කුලියට සැපයීම. |
| 19-04 | මාර්ග සංවර්ධන යන්ත්‍ර උපකරණ කුලී පදනම මත ලබා දීම. |
| | **20.වෙනත්** |
| 20-01 | කෘෂි ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු සේවාවන් සැපයීම.(බිම්මල්,සහල් පිටි නිෂ්පාදන,ධාන්‍ය හා අල බෝග,පලතුරු ආශ්‍රිත නිෂ්පාදන) |
| 20-02 | වෘත්තීය සේවා (මිණුම් කටයුතු, නීතිඥ සේවා) |
| 20-03 | බැහැරගත පුහුණු පාඨමාලා. |